# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1996/25 - 2016 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා - 2016.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවැරදි කිරීම

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2014 අගෝස්තු මස 28 දිනැති අංක 1877/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූත්, 2015.07.29 දිනැති අංක 1925/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද්දා වූත් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට පහත සඳහන් සංශෝධනයන් එක්කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. **ක්‍රියාත්මක වන දිනය :**
මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2006.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

15. **අන්තර්කාලීන විධිවිධාන :**
අන්තර්කාලය 2014.12.31 දින දක්වා බල පැවැත්වේ.
සටහන - මීට අමතරව එක් එක් දෙපාර්තමේන්තුවට විශේෂ වූ විධිවිධාන ඇත්නම් තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් කළ යුතු ය.

15.1 **II ශ්‍රේණියට උසස් කිරීම**

I. 2006.01.01 වන දිනට පෙර සේවයට බැඳී III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරියෙකු, 1988.06.07 දිනැති අංක 509/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* හා ඊට අදාළ සංශෝධිත මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ සිට II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරා තිබිය යුතු සියලු සුදුසුකම් සහ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්කාලය තුළ දී II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

II. ඉහත පරිදි සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.

15.2. **I ශ්‍රේණියට උසස් කිරීම**

I. 2006.01.01 වන දිනට පෙර සේවයට බැඳී II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෝ අන්තර්කාලය තුළ II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන්, අන්තර්කාලය තුළ දී පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන්නේ නම් එම දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(අ) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
(ආ) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම.


1A - G 24698 — 17 (2016/12)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II. ඉහත සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.

**15.3. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

I. 2006.01.01 දිනට පෙර සේවයට බැඳී I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෝ අන්තර්කාලය තුළ දී I ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන්, අන්තර්කාලය තුළ දී සේවා ව්‍යවස්ථාවේ 10.3.1 හි සඳහන් සියලුම සුදුසුකම් සපුරාලන්නේ නම්, සේවා ව්‍යවස්ථාවේ 10.3.2 හි සඳහන් පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු අනුව, ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

සටහන - මීට අමතරව එක් එක් දෙපාර්තමේන්තුවට විශේෂ වූ විධිවිධාන ඇත්නම් තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනවිරත්න,
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ 05,
නාරාහේන්පිට, නාවල පාර,
අංක 177,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

12 - 831

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.